
1. කෝප්ප හතරක රූප පහක් A, B, C, D, E මගින් දැක්වේ.




A B C D E

ඒවා අතුරෙන් එකම කෝප්පය දැක්වෙන රූප දෙක මොනවා ද?


(1) A සහ D (2) B සහ C (3) C සහ E

2. පහත රූපයේ ඇති පාවහන් අතුරෙන් එකිනෙක ගැළපෙන පාවහන් යුගල කීයක් එක්වරකදී වෙන්කර ගත හැකි ද?




(1) 4
(2) 5
(3) 6

3. කඩදාසිය මතින් පැන්සල ඉවතට නොගෙන, එකම මාර්ගයේ එක්වරකට වඩා නොයන සේ මෙම රූපය ඇඳීමට අවශ්‍ය වේ. රූපය ඇඳීම ආරම්භ කළ යුත්තේ කුමන ස්ථානයෙන් ද?




(1) A
(2) B
(3) C

4. මුලින් දී ඇති රූපය සකස් කිරීම සඳහා A, B, C, D රූප කොටස් අතුරෙන් කුමන කොටස් දෙක යොදා ගත යුතු ද?



A B C D

(1) A සහ D (2) B සහ C (3) B සහ D

5. ලොකු පොඩි කාගෙත් ළඟ ගැවසෙන්නේ
අවැසි තැනදී එළියට පිවිසෙන්නේ
මුදු පහසක් සපයා සැනසෙන්නේ
මගෙ පිරිසිදුකම වියැකී යන්නේ

PAPERMASTER.LK

මෙම කවියෙන් කියැවෙන අදහස සමග වඩාත් හොඳින් ගැළපෙන්නේ කුමක් ද?

(1) කන්නාඩිය (2) පනාව (3) ලේන්සුව

විභාග අංකය :...............................

**6.** 1 2 3 4 5, 5 6 2 4 5, 7 8 2 4 5 යන සංඛ්‍යා කාණ්ඩ තුනට පිළිවෙළින් ගැළපෙන වචන ඇතුළත් කාණ්ඩය කුමක් ද?


(1) කතරගම, මහරගම, පරණගම

(2) පරණගම, කතරගම, මහරගම

(3) පරණගම, මහරගම, කතරගම


**7.** පහත ඇති විස්තරයට අනුව අපේ ගම පිළිබඳව සකස් කර ඇති නිවැරදි දළ සටහන කුමක් ද?

අපේ ගම පිහිටියේ කඳුවැටියක් පාමුල ය. ගමේ පහළම කෙළවරින් ඔයක් ගලා බසින අතර කඳුවැටියේ සිට ගම මැද්දෙන් ගලා බසින ඇලක් ගම කෙළවරේදී ඔයට එකතු වේ. අපේ ගමේ ලස්සන දිය ඇල්ලක් ද ඇත. අපේ නිවස ඇත්තේ දිය ඇල්ලට නැගෙනහිරෙන් සහ පාසලට බටහිරෙනි.




(1) (2) (3)

**8.** අමල්, බිමල් සහ චමල් යන තිදෙනාගේ නිවෙස්වල පිහිටීම දී ඇති දළ සටහනෙහි පිළිවෙළින් A, B, C මගින් ද එම නිවෙස් යා කෙරෙන ගමන්මාර්ග වෘත්තය මගින් ද දැක්වෙයි. ඔවුහු තිදෙනා එකම මොහොතකදී තම නිවෙස්වලින් පිටත්ව ඊ හිස් මගින් දැක්වෙන දිශාවට එකම වේගයෙන් වෘත්තාකාර මාර්ගයේ ඇවිද යති. මුලින් ම අනෙක් දෙදෙනාගේ නිවෙස් පසුකර යන්නේ කවුරුන් ද?





(1) අමල් (2) බිමල් (3) චමල්

**9.** මෙම රූපයේ ත්‍රිකෝණ කීයක් අඩංගු වේ ද?


(1) 5

(2) 10

(3) 15




**10.** ඝනකයක මුහුණත් හය මත 1, 2, 3, 4, 5, 6 යන ඉලක්කම් ලියා ඇත්තේ එක් එක් මුහුණත මත එක් ඉලක්කමක් බැගින් වන පරිදි සහ එකිනෙකට ප්‍රතිවිරුද්ධ මුහුණත් මත ඇති ඉලක්කම්වල එකතුව 7 වන පරිදිත් ය. ඝනකයේ ඕනෑම මුහුණතකට යාබද මුහුණත් හතර මත ඇති ඉලක්කම්වල එකතුව කීය ද?




(1) 10 (2) 14 (3) 15

**11.** තරාදියකින් A, B සහ C ද්‍රව්‍යවල බර මනින ලද අවස්ථා තුන පහත දක්වා ඇත.




ඒ අනුව A, B සහ C ද්‍රව්‍ය තුනෙහි බර විය හැක්කේ පිළිවෙළින්,

PAPERMASTER.LK

(1) 450 g, 550 g සහ 500 g ය.

(2) 450 g, 650 g සහ 600 g ය.

(3) 600 g, 800 g සහ 750 g ය.

**12.** 1 සිට 9 තෙක් අංක යෙදූ බල්බ 9 බැගින් ඇති A සහ B පුවරු දෙකක් රූපයේ දැක්වේ.

| A පුවරුව | ① | ② | ③ | ④ | ⑤ | ⑥ | ⑦ | ⑧ | ⑨ |
|---|---|---|---|---|---|---|---|---|---|
| B පුවරුව | ⑥ | ⑤ | ⑨ | ② | ⑦ | ⑧ | ④ | ① | ③ |

A පුවරුවේ බල්බයක් දැල්වූ විට ඊට අනුරූපව B පුවරුවේ පිහිටි බල්බය ද (එනම් A පුවරුවේ ① සමග B පුවරුවේ ⑥, A පුවරුවේ ② සමග B පුවරුවේ ⑤, … ආදි වශයෙන්) දැල්වේ. පුවරු දෙකේම සමාන අංක සහිත බල්බ දැල්වෙන්නේ A පුවරුවේ කවර බල්බ හතර දැල්වූ විට ද?

(1) ①, ③, ⑥, ⑧ (2) ②, ④, ⑤, ⑦ (3) ③, ④, ⑤, ⑨

**13.** අසංක පාසල් බස් රථයට නැගීමට මිනිත්තු 25 කට පෙර කවීෂා එයට නැග්ගා ය. අමායා එන තෙක් එම බසය අමායාගේ නැවතුම්පොළෙහි මිනිත්තු 2 ක් නතර කර තිබුණි. අමායා නැග මිනිත්තු 5 කට පසුව අසංක බසයට නැග්ගේ ය. කවීෂා බස් රථයට නැග්ගේ පෙ.ව. 7.00 ට නම් අමායාගේ නැවතුම්පොළට බසය පැමිණි වේලාව කුමක් ද?


(1) පෙ.ව. 7.18 (2) පෙ.ව. 7.22 (3) පෙ.ව. 7.23

**14.** ළමයි 15 දෙනෙක් පේළි අතර දුර සමාන වන සේ රූපයේ දැක්වෙන පරිදි සිටගෙන සිටිති. තමාට උතුරු හා නැගෙනහිර යන **දෙදිශාවෙහිම** අඩුම තරමින් එක් ළමයකු බැගින්වත් සිටින ළමයි කී දෙනෙක් මොවුන් අතර සිටිත් ද?





(1) 5 (2) 8 (3) 10

**15.** රූපයේ දැක්වෙන වෘත්ත තුනම එකම තරමේ ඒවා නම් A සහ B අතර දුරට සමාන වනුයේ කුඩා කොටු කීයක දිග ද?




(1) තුනක
(2) හතරක
(3) පහක

**16.** සමාන සෘජුකෝණාස්‍ර තුනක් ඇසුරෙන් ඇඳ ඇති මෙම රූපයේ වටේ දිග, එක් සෘජුකෝණාස්‍රයක වටේ දිග මෙන්



(1) හරියටම දෙගුණයකි.
(2) දෙගුණයට වඩා අඩු ය.
(3) දෙගුණයට වඩා වැඩි ය.

**17.** එක්තරා මාසයක 9, 13 සහ 17 යන දින තුනෙන් දින දෙකක් සෙනසුරාදා සහ ඉරිදා වේ. අනෙක් දිනය කුමන දවසක් ද?

(1) බදාදා (2) බ්‍රහස්පතින්දා (3) සිකුරාදා

PAPERMASTER.LK

**18.** මිතුරන් කණ්ඩායමක් බෝලයක් මිලදී ගැනීම සඳහා සෑම අයකුගෙන්ම රුපියල් 10 බැගින් එකතු කළ විට රුපියල් 5 ක් මදි වේ. සෑම අයකුගෙන්ම රුපියල් 12 බැගින් එකතු කළ විට රුපියල් 5 ක් ඉතුරු වේ. කණ්ඩායමේ සිටින මිතුරන් ගණන කීය ද?

(1) 4 (2) 5 (3) 6

**19.** පන්තියක සෑම සිසුවකුම සතියේ පාසල පැවැත්වෙන දින පහ අතුරෙන් එක ළඟ පිහිටි දින තුනක් ක්‍රීඩා පුහුණුවීම්වලට සහභාගී විය යුතු ය. එක්තරා සතියක විනුක, දනුක සහ චනුක යන සිසුන් තිදෙනාම ක්‍රීඩා පුහුණුවීම්වලට සහභාගි වූ දවස් තිබුණේ එකක් පමණක් නම්, එම සතියේ ඔවුන්ගෙන් දෙදෙනෙකු බැගින් ක්‍රීඩා පුහුණුවීම්වලට සහභාගි වූ දවස් කීයක් තිබුණේ ද?

(1) 2 (2) 3 (3) 4

**20.**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **පළමුවන පේළිය** | : | 1 | 6 | 7 | … | … | … |
| **දෙවන පේළිය** | : | 2 | 5 | 8 | … | … | … |
| **තුන්වන පේළිය** | : | 3 | 4 | 9 | 10 | … | … |


ඉහත දැක්වෙන රටාවට අනුව සංඛ්‍යා ලියාගෙන ගිය විට 31 ලිවිය යුතු වන්නේ කීවෙනි පේළියේ ද?

(1) පළමුවන පේළියේ (2) දෙවන පේළියේ (3) තුන්වන පේළියේ

**21.** බිත්ති ඔරලෝසුවක මුහුණතෙහි ඇති සියලුම සංඛ්‍යා i, v සහ x යන රෝම ඉලක්කම් ඇසුරෙන් සම්මත ආකාරයට ලියා තිබේ. එහි ඇති i, v සහ x යන සංඛ්‍යාංක යෙදී ඇති වාර ගණන පිළිවෙළින්,

(1) 14, 4 සහ 3 කි. (2) 17, 4 සහ 4 කි. (3) 17, 5 සහ 4 කි.

**22.** කැවුම්, කොකිස්, අලුවා, ආස්මී, කේක් සහ දොදොල් වෙන වෙනම අඩංගු සමාන පෙට්ටි හයක් මේසයක් මත රූපයේ දක්වා ඇති ආකාරයට අසුරා ඇත.



මේසය

* පෙට්ටි හතරකම ගෑවෙමින් ඇත්තේ කොකිස් අඩංගු පෙට්ටියයි.
* ආස්මී පෙට්ටිය ගෑවෙන්නේ දොදොල් පෙට්ටියේ සහ කේක් පෙට්ටියේ පමණි.

ඉහළින්ම තිබෙන පෙට්ටියේ ඇත්තේ මොනවා ද?

(1) ආස්මී (2) කැවුම් (3) අලුවා

**23.** පහත දැක්වෙන්නේ එක්තරා සිදුවීමක අවස්ථා පහකි.

a - බල්ලා පාරේ ඒ මේ අත දුවන්න වුණා.
b - බෝලයක් පසුපස ළමයෙක් වේගයෙන් දුවගෙන ආවා.
c - පාර දිගේ වේගයෙන් පැමිණි රථයක් එක්වරම තිරිංග තද කළා.
d - බෝලය අහුලාගත් ළමයා පාරෙන් ඉවතට ගියා.
e - බෝලය පෙරළීගෙන ගොස් පාරේ වැතිර සිටි බල්ලකුගේ ඇඟේ වැදුනා.

එම අවස්ථාවල **වඩාත් ගැළපෙන** අනුපිළිවෙළ කුමක් ද?

(1) e, c, a, b, d (2) b, e, a, d, c (3) b, e, a, c, d

**24.** එක්තරා දවසක වූ සිදුවීමක අවස්ථා හතරක් A, B, C, D රූප මගින් දැක්වේ.




A B C D


එම සිදුවීම නිවැරදිව දැක්වීම සඳහා රූප ගැළපිය යුතු අනුපිළිවෙළ කුමක් ද?

(1) B, D, A, C (2) B, D, C, A (3) D, B, C, A


**25.**




ඉහත රටාව අනුව ? ලකුණින් දැක්වෙන ත්‍රිකෝණයට ගැළපෙන රූපය කුමක් ද?



(1)




(2)



(3)

**26.** A තුළ ඇති සංඛ්‍යාවල එකතුවත් B තුළ ඇති සංඛ්‍යාවල එකතුවත් සමාන වන පරිදි A සහ B අතර සංඛ්‍යා **අඩුතම** ගණනක් හුවමාරු කිරීමට අවශ්‍ය වේ. ඒ සඳහා කළ යුත්තේ,




(1) A තුළ ඇති කුඩාම සංඛ්‍යාව B ට දීම පමණයි.

(2) A ගෙන් සංඛ්‍යාවක් B ට ද B ගෙන් සංඛ්‍යාවක් A ට ද දීමයි.

(3) A ගෙන් සංඛ්‍යා දෙකක් B ට ද B ගෙන් එක් සංඛ්‍යාවක් A ට ද දීමයි.

**27.** ශිෂ්‍යයින් 11 දෙනකු පේළියක සිටගෙන සිටින්නේ 1, 3, 5, 7, 9 සහ 11 ස්ථානවල සිටින අය ඉදිරියටත් අනෙක් අය පසුපසටත් මුහුණලාගෙන ය.

පළමුවන අත්පුඩියේදී 1 වැනි ශිෂ්‍යයාත් 11 වැනි ශිෂ්‍යයාත් පමණක් පිටුපසට හැරෙති.
දෙවන අත්පුඩියේදී 2 වැනි ශිෂ්‍යයාත් 10 වැනි ශිෂ්‍යයාත් පමණක් ඉදිරිපසට හැරෙති.
තුන්වැනි අත්පුඩියේදී 3 වැනි ශිෂ්‍යයාත් 9 වැනි ශිෂ්‍යයාත් පමණක් පිටුපසට හැරෙති.

මේ ආකාරයට සිදුවන විට එකළඟ සිටින ශිෂ්‍යයින් තිදෙනකුම එකම පැත්තට හැරී සිටින අවස්ථාව පළමුවෙන්ම ලැබෙන්නේ කීවැනි අත්පුඩියේදී ද?

(1) හතරවැනි (2) පස්වැනි (3) හයවැනි

**28.** 485, 707, 747 හා 27265 යන සංඛ්‍යා පහළටත්, 46, 75, 7274 හා 7275 යන සංඛ්‍යා හරහටත් ලැබෙන පරිදි කොටුදැල සම්පූර්ණ කළ විට එහි දෙවන පේළියේ හරහට ලැබෙන සංඛ්‍යාව කුමක් ද?



(1) 707 (2) 708 (3) 748

**29.** රූපයේ දැක්වෙන හැඩය ත්‍රිකෝණාකාර හැඩයක් ලෙස සම්පූර්ණ කිරීමට දී ඇති ආකාරයේම කුඩා සමචතුරස්‍ර හා ත්‍රිකෝණ හැඩ කීයක් **අවම** වශයෙන් ඊට එකතු කළ යුතු ද?



(1) සමචතුරස්‍ර 1 හා ත්‍රිකෝණ 4


(2) සමචතුරස්‍ර 2 හා ත්‍රිකෝණ 3

(3) සමචතුරස්‍ර 3 හා ත්‍රිකෝණ 2

PAPERMASTER.LK

[හත්වැනි පිටුව බලන්න

30. A, B සහ C කම්බි තුනක් නවා සකස් කරන ලද රාමු තුනක් පහත දැක්වේ.





A B C

ඒවායින් දිග වැඩිම කම්බිය කුමක් ද?

(1) A (2) B (3) C

31. ළමයෙක් තම නිවස ඉදිරිපිට පාරේ පැයක කාලයක් තුළ ගමන් කළ වාහන පිළිබඳව පහත ආකාරයේ සටහනක් සකස් කළේ ය. ඒවා ගමන් කළ දිශාව හඳුනාගැනීමට → සලකුණ ද භාවිත කර ඇත.




හත්වැනි වාහනය ලෙස ගමන් කළේ නගරය දෙසට ගිය බස් රථයයි. එය 

මගින් නිරූපණය කරනු ලැබුවේ නම් පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) නගරය දෙසින් පැමිණ ඇත්තේ වාහන තුනක් පමණි.
(2) යතුරු පැදි සියල්ල ගමන් කර ඇත්තේ නගරය දෙසට ය.
(3) මුල් පැය බාගය තුළ ගමන් කර ඇත්තේ වාහන 5 ක් පමණි.

32. සිසුන් කණ්ඩායමක නායිකාව ලෙස එම කණ්ඩායමේ තාරකී තෝරාගන්නා ලදී. ඉතුරු සිසුන්ගෙන් උපනායිකාවක හා උපනායකයකු තෝරාගත හැකි ආකාර ගණන 6 කි. එම කණ්ඩායමේ සිටින ගැහැනු ළමයින් ගණන සහ පිරිමි ළමයින් ගණන විය හැක්කේ පිළිවෙළින්,

(1) 2 සහ 3 කි. (2) 2 සහ 4 කි. (3) 3 සහ 3 කි.

33. සුළි කුණාටුව පිළිබඳ පුවත ඇසූ ජයලාල් මහතා, තම පවුලේ විනෝද චාරිකාව සඳහා මුහුදු වෙරළේ නිවාඩු නිකේතනයට යෑම වෙනුවට කඳුකර ප්‍රදේශයක පිහිටි පැරණි අලංකාර ගොඩනැගිල්ලක් නැරඹීමට යෑමටත්, එහි නවාතැන් ගැනීමටත් තීරණය කළේ ය. එය ටිකක් මිල අධික වුවත් කෙටි දැනුම් දීමකින් වෙන්කර ගැනීමට හැකිවීම, ඔහුට මහත් අස්වැසිල්ලක් විය.

ඉහත ඡේදය අනුව වඩාත්ම නිවැරදි වන්නේ පහත දැක්වෙන කුමන ප්‍රකාශය ද?

(1) කඳුකරයේ පිහිටි ගොඩනැගිල්ලේ මිල අධික වන්නේ එය පැරණි නිසා ය.
(2) ජයලාල් මහතා පවුලේ චාරිකා සැලසුම් කරන්නේ ඔහු ධනවතකු නිසා ය.
(3) ජයලාල් මහතා චාරිකාවේ සැලසුම වෙනස් කළේ සුළි කුණාටුව නිසා ය.

34. භාජනයකින් $\frac{1}{4}$ ක් වන සේ සීනි දැමූ විට එහි බර 300 g කි. එය සම්පූර්ණයෙන්ම සීනිවලින් පිරවූ විට බර 900 g කි. හිස් භාජනයේ බර කොපමණ ද?

(1) 200 g (2) 100 g (3) 75 g

35. තෑගි පාර්සලයක් පහත දැක්වෙන පරිදි ද්‍රව්‍ය තුනක් අඩංගු වන සේ සකස් කෙරේ.


* තනිරූල් පොතක් හෝ කොටුරූල් පොතක්
* පෑනක් හෝ පැන්සලක්
* කෝදුවක් හෝ මකන කැල්ලක්

PAPERMASTER.LK

මේ අනුව එකිනෙකට වෙනස් වන පරිදි ආකාර කීයකට තෑගි පාර්සල් සකස් කළ හැකි ද?

(1) 3 (2) 6 (3) 8

**36.** පහත ඇති A, B, C සහ D යන සංඛ්‍යාපත් බලන්න.




**පියවර 1:-** A සංඛ්‍යාපත තිරස්ව තබන්න.
**පියවර 2:-** A හි ඇති 6 මත B හි ඇති 6 සිටින සේ B සංඛ්‍යාපත සිරස්ව තබන්න.
**පියවර 3:-** B හි ඇති 5 මත C හි ඇති 5 සිටින සේ C සංඛ්‍යාපත තිරස්ව තබන්න.
**පියවර 4:-** A වල ඇති 7 සහ C වල ඇති 4 මත D හි ඇති 7 හා 4 සිටින සේ D සංඛ්‍යාපත තබන්න.

ඉහත පියවර අනුගමනය කළ පසු සංඛ්‍යාපත් සැකැස්ම දැකිය හැකි රූපය කුමක් ද?

(1)

| | | |
|---|---|---|
| | 5 | 8 |
| 8 | 7 | 5 |
| 4 | 7 | 6 |

(2)

| | | |
|---|---|---|
| | 5 | 5 |
| 5 | 4 | 8 |
| 4 | 7 | 6 |

(3)

| | | |
|---|---|---|
| | 5 | 8 |
| 8 | 4 | 5 |
| 4 | 7 | 6 |

**37.** රූපයේ දැක්වෙන කොටුදැල එක් කොටසකට සංඛ්‍යා තුන බැගින් වන පරිදි කොටස් තුනකට කපා වෙන් කළ විට එක් කොටසක අඩංගු වූ සංඛ්‍යාවල එකතුව 20 කි. අනෙක් කොටස් දෙකෙහි අඩංගු සංඛ්‍යාවල එකතුව වෙන වෙනම ගත් විට ඒවා,


| | | |
|---|---|---|
| 1 | 2 | 3 |
| 6 | 5 | 4 |
| 7 | 8 | 9 |


(1) 9 සහ 16 වේ.  (2) 10 සහ 15 වේ.  (3) 11 සහ 14 වේ.

**38.** පාසලේ ශ්‍රමදානය සඳහා 5 වන ශ්‍රේණියේ සිසුන්ගේ සහභාගිත්වය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.
A පන්තියෙන් සහ B පන්තියෙන් පැමිණි මුළු සිසුන් ගණන 11 කි.
C පන්තියෙන් සහ D පන්තියෙන් පැමිණි මුළු සිසුන් ගණන 33 කි.
B පන්තියෙන් සහ C පන්තියෙන් පැමිණි මුළු සිසුන් ගණන 17 කි.
ඒ අනුව A පන්තියෙන් සහ D පන්තියෙන් පැමිණි මුළු සිසුන් ගණන කීය ද?

(1) 22  (2) 27  (3) 39

**39.** කුඩා ඝනක සමූහයක් එකිනෙක සම්බන්ධ කර ගොඩනගා ගත් සැකැස්මක් පළමුවන රූපයෙන් ද එය වට බාගයක් කරකැවූ විට දැකිය හැකි ආකාරය දෙවන රූපයෙන් ද දැක්වේ.


පළමුවන රූපය


දෙවන රූපය

සැකැස්මෙහි වැඩිම වශයෙන් තිබිය හැකි කුඩා ඝනක සංඛ්‍යාව කීය ද?

(1) 17  (2) 18  (3) 19

**40.** අමල්, නිමල් මෙන් අඹවලට පමණක් කැමති අයෙක් නොවේ. ......... Ⓐ සහ වෙනත් පලතුරුවලට අකමැති සුනිල් දොඩම්වලට කැමති ය. අන්නාසි ......... Ⓑ කැමති පලතුරක් නොවේ.

මෙම ඡේදයේ Ⓐ සහ Ⓑ හිස්තැන්වලට පිළිවෙළින් ගැළපෙන වචන යුගලය කුමක් ද?

(1) නිමල්, සුනිල්  (2) නිමල්, අමල්  (3) අමල්, සුනිල්

PAPERMASTER.LK

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

5

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, 2025 - MODEL QUESTION PAPER

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගයට පුහුණු වීමේ ප්‍රශ්න පත්‍රය - 2025

# II පත්‍රය

පැය 1යි මිනිත්තු 15යි.

විභාග අංකය .............................................

## විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60**ක් ඇත. සමහර ප්‍රශ්නවල අනු කොටස් ද ඇත.
* **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම** සපයන්න.
* පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවලට **තිත් ඉරි මත** පිළිතුරු ලියන්න.
* පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න**.
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

## උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව ඉලක්කමෙන් | |
| එකතුව අකුරෙන් | |

| | කෙටි අත්සන් හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක** පළමුවන පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ එකතුව නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. එකතුව නිවැරදි ය. | V/I/S/CH |

PAPERMASTER.LK

1. පහත දැක්වෙන ඡේදය කියවන්න.

දිනිති තම යහළුවන් සමඟ පන්තිකාමරය දෙසට ගමන් කළේ, තුන ශ්‍රේණියේදී ඔවුන් විසින් සිටුවන ලද මල් සහ පලතුරු ගස් අතරින් ය. තන්දේගෙදර ප්‍රාථමික විද්‍යාලයේ පහ ශ්‍රේණියේ ඉගෙනුම ලබන මෙම සිසුන් ලබන වසරේදී අලුත් පාසලකට යාමට නියමිත ය.

මලින් සහ පලින් බර ගස් අතරින් ගමන් ගන්නා ඔවුන්ට පාසලෙන් අස් වී යොස් ඇති තිසරු සිහි වූයේ, මෙම පැළ රෝපණයේදී ඔහු මූලිකත්වය ගෙන කටයුතු කළ බැවිනි. මෙහිදී දිනිති යෝජනා කළේ වෙනත් පාසලකට යාමට පෙර තිසරු මෙන් අලුත් දෙයක් කළ යුතුයි යන්නයි. ඒ අනුව දර්ශිගේ යෝජනාව වූයේ පාසලේ ප්‍රධාන ශාලාවේ බිත්ති දෙකක ලෝක සිතියමක් සහ ශ්‍රී ලංකා සිතියමක් අඳිමු යන්නයි. එම යෝජනාව පන්තියේ සියලු දෙනා සමඟ සාකච්ඡා කර ඊට එකඟ වූ බැවින් ඒ බව සිසුන් විසින් පන්තිභාර ගුරුතුමියට දන්වන ලදී. එම අදහසට එකඟ වූ ගුරුතුමිය එය අගය කරමින් එහි වැදගත්කම පැහැදිලි කරන ලදී. අවසානයේ මෙම අදහස විදුහල්පතිතුමාට දන්වා අවසර ලබාගත යුතු බව ද ඇය පැවසුවා ය.

- **ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

(i) ඉහත ඡේදයේ සඳහන් පාසලේ නම කුමක් ද?

..............................................................................................................

(ii) පැළ රෝපණය සඳහා මූලිකත්වය ගත්තේ කවුද?

..............................................................................................................

(iii) මෙම පැළ සිටුවන විට දිනිති සහ යහළුවන් ඉගෙනුම ලැබුවේ කුමන ශ්‍රේණියේ ද?

..............................................................................................................

(iv) පාසලේ ප්‍රධාන ශාලාවේ බිත්ති දෙකක ඇඳීමට, දර්ශි යෝජනා කළේ මොනවා ද?

..............................................................................................................

(v) සිසුන්ගේ යෝජනාවට පන්තිභාර ගුරුතුමිය අවසානයේදී පැවසුවේ කුමක් ද?

..............................................................................................................

..............................................................................................................

(vi) 'පරණ' යන්නට විරුද්ධ පදයක් මෙම ඡේදයේ සඳහන් වේ. එය කුමක් ද?

..............................................................................................................

(vii) 'පුෂ්ප' යන්නට සමානාර්ථය දෙන පදයක් මෙම ඡේදයේ සඳහන් වේ. එය කුමක් ද?

..............................................................................................................

2. පහත සඳහන් එක් එක් වගන්තියට ගැළපෙන නිවැරදි ආඛ්‍යාත පදය වරහන් තුළින් තෝරා **යටින් ඉරක් අඳින්න.**

(i) ගුරුවරියෝ අපට නිසි මග ............................ (පෙන්නුවා ය. / පෙන්නුවෝ ය.)

(ii) කවිඳු, අම්මා සමඟ පොළට ............................ (යති. / යයි.)

(iii) මී මැස්සා ද සමනලයා ද මල්පැණි ............................ (බොති. / බොයි.)

PAPERMASTER.LK

(iv) උන් නිදහසේ පියාඹා ............................ (ගියේ ය. / ගියෝ ය.)

(v) ඔවුහු දරුවන්ට අවවාද ............................ (කළේ ය. / කළෝ ය.)

**3.** පහත සඳහන් වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

(i) රුවන් ක්‍රීඩා පිටියට උදෙන් ම පැමිණෙයි.

.............................................................................................................................

(ii) මම පේරාදෙණිය මල්වත්ත නැරඹීමට යමි.

.............................................................................................................................

**4.** පහත සඳහන් එක් එක් නාම පදය අයත් වන නාම පද වර්ගය තිත් ඉර මත ලියන්න.

(i) පුස්තකාලය - ........................................

(ii) පොත් - ........................................

**5.** පහත දැක්වෙන එක් එක් වගන්තියේ වැරදි අක්ෂර සහිත වචන **දෙක** බැගින් ඇත. එම **වචන පමණක් නිවැරදි** කර අදාළ තිත් ඉරි මත ලියන්න.

(i) වෛද්‍යවරිය රෝගියා පරීක්සා කළා ය.

........................................ ........................................

(ii) ගුරුතුමාගේ දේසනය ප්‍රයෝජණවත් විය.

........................................ ........................................

**6.** යුගල පද සම්පූර්ණ කරන්න.

(i) ගෙවල් ........................................

(ii) වතු ........................................

**7.** නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

(i) ප්‍රථම පුරුෂ අතීත කාල බහුවචන ක්‍රියා පදයකි. (වැටුණේ ය / වැටුණෝ ය / වැටෙති)

..............................................................................

(ii) උත්තම පුරුෂ ඒකවචන වර්තමාන කාල ක්‍රියා පදයකි. (අනුභව කරමි / අනුභව කළේ ය / අනුභව කළෙමි)

..............................................................................

**8.** පහත දැක්වෙන වගන්තියෙහි අදාළ ස්ථානවල විරාම ලකුණු යොදන්න.

| |
|---|
| මෙම පොතෙහි ප්‍රශ්න කිහිපයක් සඳහන් වේ ඔබ පිටු අංක 5 හි තිබෙන ප්‍රශ්න කියෙව්වෙහි ද |


**9.** පහත වචන නිවැරදිව ගළපා වගන්තිය නැවත ලියන්න.

වාර්තාව / සැමට / පිළිබඳ / ඉතා / කාලගුණය / ප්‍රයෝජනවත් වේ

.............................................................................................................................


**10.** එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ **ඉංග්‍රීසි** අකුරෙන් ම ලියන්න.

(i)



| | | | | |
|---|---|---|---|---|

(ii)



| | | | |
|---|---|---|---|

PAPERMASTER.LK

11. පහත දී ඇති වචන නිවැරදිව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

(i) in / Farmer / paddy / works / field / the

..........................................................................................

(ii) school / come / bicycle / to / I / by

..........................................................................................

12. එක් එක් ඉංග්‍රීසි වචනයෙහි අර්ථය **සිංහලෙන්** ලියන්න.

(i) River : .................................. (ii) National Anthem : ..................................


13. 'මාණවී (மாணவி)' යන දෙමළ වචනය සඳහා යෙදෙන **සිංහල** වචනය ලියන්න.

..........................................................................................

14. පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය **සිංහලෙන්** ලියන්න.

ගිරවා කොළ පාටයි. : ..........................................................................................

15. පහත ගණක රාමුවෙහි නිරූපිත සංඛ්‍යාව අකුරෙන් ලියන්න.




..................................................................

16. 24537, 24735, 24375 යන සංඛ්‍යා **තුන** ආරෝහණ පිළිවෙළට ලියන්න.

......................... , ......................... , .........................


17. 0.7 දහයෙන් පංගුවක් ලෙස ලියන්න. ..................................................

18. පහත කොටුව තුළ ඇති ඉලක්කම්වලින් සෑදිය හැකි ඉලක්කම් හතරේ කුඩා ම සංඛ්‍යාව සහ විශාල ම සංඛ්‍යාව අතර වෙනස කීය ද?

| | |
|---|---|
| 7 | 0 |
| 6 | 4 |

..................................................

19. මෙම සංඛ්‍යා රටාවේ ඊළඟට එන සංඛ්‍යා **දෙක** ලියන්න. 1, 3, 9, 27, ............ , ............

20. 


රූපයේ ඇති A භාජනයේ ජලය 1 l ක් ද, B භාජනයේ ජලය 500 ml ක් ද ඇත. භාජන දෙකෙහි ම ජල ප්‍රමාණ සමාන වීමට A භාජනයෙන් B භාජනයට දැමිය යුතු ජල ප්‍රමාණය කොපමණ ද?

.......................................... ml

21. අනුරාධපුරයෙන් පෙ.ව. 10.00 ට ගමන් ආරම්භ කළ බස්රථයක් එදින ම ප.ව. 3.45 ට යාපනයට ළඟා විය. බස්රථයට එම ගමන සඳහා ගත වූ කාලය පැය හා මිනිත්තුවලින් කොපමණ ද?

PAPERMASTER.LK

පැය .................... මිනිත්තු ....................

22. එක් අයකුට 6 බැගින් වන සේ පොත් 636 ක් සිසුන් කී දෙනකු අතර බෙදා දිය හැකි ද?

..................................................

**23.** මල්ලක හාල් 12 kg 500 g ක් තිබුණි. එයට තව හාල් 8 kg 750 g ක් දැමූ විට මල්ලෙහි ඇති හාල්වල මුළු බර කොපමණ ද?

: .................. kg .................. g

**24.** සමචතුරස්‍ර හැඩයේ මුහුණත් 6 ක් සහිත ඝන වස්තුවකට තිබෙන දාර ගණන කොපමණ ද?

: ........................................

**25.** 5 m ක් දිග රිබන් පටියකින් 3 m 75 cm ක දිග ප්‍රමාණයක් කපා ඉවත් කරන ලදී. ඉතිරි වූ රිබන් පටියේ දිග කොපමණ ද?

: .................. m .................. cm

- වෙළඳසැලක ප්‍රදර්ශනය කර ඇති මිල දර්ශනයක් පහත දැක්වේ. එම මිල දර්ශනයට අනුව **26** සහ **27** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| ද්‍රව්‍යය | 1 kg ක මිල රුපියල් | සත |
|---|---|---|
| හාල් | 250 | 00 |
| සීනි | 220 | 00 |
| පරිප්පු | 360 | 00 |
| අල | 120 | 00 |

**26.** හාල් 3 kg ක් සහ පරිප්පු 500 g ක් මිලදී ගත් අයකු ගෙවිය යුතු මුදල කීය ද?

: ........................................


**27.** සීනි 250 g ක් සහ අල 2 kg ක් මිලදී ගත් අයකු එම මුදල ගෙවීම සඳහා රුපියල් 500 ක නෝට්ටුවක් දුන්නේ නම් ලැබෙන ඉතුරු මුදල කීය ද?

: ........................................

**28.** බාල්දියකට ජලය 6 *l* 500 ml ක් දැමිය හැකි ය. දැනට එහි ජලය 2 *l* 650 ml ක් ඇත. බාල්දිය සම්පූර්ණයෙන් පිරවීමට තව ජලය කොපමණ ප්‍රමාණයක් අවශ්‍ය ද?

: ............... *l* ...............ml

**29.** සිසුන් කණ්ඩායමක එක් එක් සිසුවා වඩාත් ම කැමති ක්‍රීඩාව පිළිබඳ තොරතුරු පහත ප්‍රස්ථාරයේ දක්වා ඇත. නමුත් දැල්පන්දු ක්‍රීඩාවට කැමති සංඛ්‍යාව පමණක් ප්‍රස්ථාරයේ ඇඳ දක්වා නැත.




(i) ක්‍රිකට් ක්‍රීඩාවට වඩා අත්පන්දු ක්‍රීඩාවට සිසුන් කී දෙනකු කැමති ද?

: ..............................

(ii) කණ්ඩායමේ සිසුන් 60 ක් සිටී නම් දැල්පන්දු ක්‍රීඩාවට කැමති සිසුන් සංඛ්‍යාව කීය ද?

: ..............................

- අංක **30** සිට **59** තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර, දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා **යටින් ඉරක් අඳින්න**

**30.** වැලක සැදෙන පුෂ්පයක් වන්නේ,
(1) සමන්පිච්ච ය. (2) අරලිය ය. (3) සේපාලිකා ය.

**31.** ශ්‍රී ලංකාවේ මුහුදු වෙරළක් මායිමට එක් වී ඇති පළාත් සංඛ්‍යාව,
(1) 4 කි. (2) 5 කි. (3) 6 කි.

PAPERMASTER.LK

**32.** බිත්තර **නොදමන** සතුන් පමණක් සඳහන් පිළිතුර කුමක් ද?
(1) නයා, හාවා (2) මීයා, ලේනා (3) ඉබ්බා, කටුස්සා

33. හානි කරන කෘමීන්ගෙන් වගාව ආරක්ෂා කිරීමට අවශ්‍ය දියර සකස් කර ගැනීමට යොදා ගත හැකි ශාකයකි.
(1) කොහොඹ. (2) කොස්. (3) තේක්ක.

34. ශ්‍රී ලාංකිකයින් තුළ දේශාභිමානය ජනිත කරවීම සඳහා කවි පොත් කිහිපයක් ම රචනා කළ ලේඛකයෙකි.
(1) ශ්‍රීමත් ආතර් සී. ක්ලාක් මැතිතුමා.
(2) ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මැතිතුමා.
(3) එස්. මහින්ද හිමි.

35. කොළ කැඳ සකස් කර ගැනීමට යොදා ගන්නා දේ පමණක් අඩංගු පිළිතුර කුමක් ද?
(1) රණවරා, කතුරුමුරුංගා, කංකුං
(2) හාතාවාරිය, ගොටුකොළ, වැල්පෙනෙල
(3) සාරණ, පොල්පලා, තිබ්බොටු

36. පහත කුමන මිශ්‍රණය, චුම්බකයක් භාවිතයෙන් වෙන් කර ගත හැකි ද?
(1) ඇලුමිනියම් ඇණ සහ ප්ලාස්ටික් බොත්තම්
(2) යකඩ කුඩු සහ වැලි
(3) වීදුරු කැබලි සහ රිජිෆෝම් කැබලි

37. පදිකයන්ට 'පාර හරහා මාරු නොවන්න' යන පණිවිඩය ලබාදෙන ආලෝක සංඥාව රූපයේ දක්වා ඇත. එම ආලෝක සංඥාව දැල්වෙන වර්ණය කුමක් ද?



(1) රතු
(2) කොළ
(3) කහ


38. සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳ සැලකීමේදී දත් බුරුසුව, තුවාය, කෝප්පය සහ නිදන කොට්ටය යන දේවල් පරිහරණය කිරීම සම්බන්ධයෙන් නිවැරදි වගන්තිය කුමක් ද?
(1) සියල්ල ම පොදුවේ පරිහරණය කළ යුතු දේ ය.
(2) සියල්ල ම පෞද්ගලිකව පරිහරණය කළ යුතු දේ ය.
(3) පෞද්ගලිකව පරිහරණය කළ යුත්තේ දත් බුරුසුව පමණි.

39. පිරිසිදු ජලය රත් වී නටන අවස්ථාව වන විට,
(1) වාෂ්ප පිටවෙයි. (2) බුබුළු දැමීම නවතියි. (3) පැහැය වෙනස් වෙයි.

40. අතීතයේදී කාන්තාවන් සහභාගී **නොවූ** ජන ක්‍රීඩාව කුමක් ද?
(1) මළිඳ කෙළිය (2) පංච දැමීම (3) පොරපොල් ගැසීම

41. 'මහා මාර්ග අනතුරු සහ ප්‍රථමාධාර' පිළිබඳව සිසුන් දැනුවත් කිරීම සඳහා ආරාධනා කිරීමට වඩාත් සුදුසු ආයතන **දෙක** වන්නේ,
(1) ශ්‍රී ලංකා පොලිසිය සහ පාරිභෝගික ආරක්ෂක අධිකාරියයි.
(2) රතු කුරුස සංවිධානය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයයි.
(3) ශ්‍රී ලංකා පොලිසිය සහ රතු කුරුස සංවිධානයයි.

42.



සුමට පොළොව රළු පොළොව

තල්ලු කිරීම වඩා පහසුවන්නේ කුමන පොළොව මත ද යන්න සෙවීම සඳහා සිසුන් සැලසුම් කළ මෙම ක්‍රියාකාරකම නිවැරදි විය යුතු බව ගුරුතුමා පවසන ලදී. ඒ සඳහා සිසුන් ඉදිරිපත් කළ යෝජනා පහත දැක්වේ.

A - පෙට්ටි දෙක ම සමාන බරින් විය යුතු බව
B - පෙට්ටි දෙකේ ම පොළොවේ ගෑවෙන ප්‍රමාණ සමාන විය යුතු බව
C - පෙට්ටි දෙක ම සමාන උසකින් යුතු බව

PAPERMASTER.LK

නිවැරදි යෝජනා පමණක් අඩංගු පිළිතුර කුමක් ද?
(1) A හා B (2) A හා C (3) B හා C

43. පහත ක්‍රම අතුරෙන් පණිවිඩය ඉක්මනින් ම ලබා දිය හැකි ක්‍රමය කුමක් ද?
(1) ලිපියක් තැපැල් කිරීම (2) විදුලි පණිවිඩයක් යැවීම (3) දුරකථන ඇමතුමක් ලබා දීම

44. ශාකවල හටගන්නා පලවල කාර්යයක් **නොවන්නේ**,
(1) බීජ ආරක්ෂා කර ගැනීමයි.
(2) මේරූ බීජ පැලවීමේදී අවශ්‍ය පෝෂණය ලබා දීමයි.
(3) බීජවලට විසිරීමට උපකාරී වීමයි.

45. ගොටුකොළ සලාදයක් පිළියෙල කිරීමට අනුගමනය කළ පියවර පහතින් දක්වා ඇත.
A - සිහින්ව ලියූ ගොටුකොළ හොඳින් සෝදා ගන්නා ලදී.
B - පිරිසිදු කර ගත් ලූනු සහ අමු මිරිස් සිහින්ව ලියා ගන්නා ලදී.
C - සිහින්ව ලියාගත් ද්‍රව්‍යවලට පොල්, ලුණු සහ දෙහි ඇඹුල් යොදා මිශ්‍ර කරන ලදී.
මෙයින් **වැරදි** ලෙස ක්‍රියා කර ඇත්තේ කුමන පියවරේ ද?
(1) A (2) B (3) C

46. කඩොලාන ශාක පිළිබඳ සඳහන් කර ඇති නිවැරදි වගන්තිය කුමක් ද?
(1) වියළි කලාපයේ අඩු ජලය සහිත පසේ වැවෙන ශාක වේ.
(2) කඳුකර ප්‍රදේශවලට පමණක් සීමා වූ ශාක වේ.
(3) වෙරළ ආශ්‍රිත මඩුරු බිම්වල වැඩි වශයෙන් වැවෙන ශාක වේ.

47. පහත සඳහන් කුමන ක්‍රියාව මගින් අනෙකුත් පුද්ගලයින් අපහසුතාවට පත්විය හැකි ද?
(1) බස් රථ තුළ අධික ශබ්දයෙන් ගීත ප්‍රචාරය කිරීම
(2) බසයට නැගීමට තම වාරය එනතුරු පෝලිමේ සිටීම
(3) බොහෝ වාහන ගමන් කරන මාර්ගයක කහ/සුදු ඉර මතින් පමණක් පාර පැනීම

48. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) පිරිසිදු ජලයට නිශ්චිත සුවඳක් ඇත.
(2) පිරිසිදු ජලයට නිශ්චිත වර්ණයක් ඇත.
(3) පිරිසිදු ජලයට නිශ්චිත පරිමාවක් ඇත.

49. මුහුදේ ගමන් කරන නැවක් විශාල ගංගාවකට ඇතුළු කළ විට නැවට සිදු විය හැකි දේ කුමක් ද?
(1) මුහුදේ ගිලී තිබූ මට්ටමට වඩා තරමක් ඉහළට යයි.
(2) මුහුදේ ගිලී තිබූ මට්ටමට වඩා තරමක් පහළට ගිලෙයි.
(3) මුහුදේ හා ගංගාවේදී එක ම ප්‍රමාණයට ගිලී පවතියි.

50. ඡප්‍රනයක් අලංකාර කර ගැනීමට භාවිත කළ හැකි විසිතුරු මැහුම් ක්‍රමයක් වන්නේ මින් කුමක් ද?
(1) නූල් ද්‍රවවීම (2) වාටි මැස්ම (3) දම්වැල් මැස්ම


51. ඖෂධීය ගුණයෙන් යුතු පඳුරක් ලෙස වැඩෙන ඒක දේශීය ශාකයකි,
(1) ගොඩපර. (2) හීං බෝවිටියා. (3) කරපිංචා.

52. බඳුනක සාරවත්ව වැවී ඇති ඉඟුරු පැලයක පත්‍ර දහවල් හද අව්වට හැකිලෙන බවත් සවස් වන විට නැවත දිග හැරෙන බවත් නිරීක්ෂණය වුණි. එයට හේතුව කුමක් විය හැකි ද?
(1) පත්‍රවලින් ජලය වාෂ්පවීම අඩුකර ගැනීමට
(2) පසේ ඇති පොහොර හොඳින් උරා ගැනීමට
(3) සමනලයින් වැනි සතුන් පත්‍රවල බිත්තර දැමීම වළකාලීමට

53. චිකුන්ගුන්‍යා රෝගය බෝවන්නේ,
(1) අපිරිසිදු ජලය පානය කිරීමෙනි.
(2) රෝග වාහක මදුරුවන් දෂ්ට කිරීමෙනි.
(3) රෝග වාහක පුද්ගලයන් මගිනි.


54. ආහාර නාස්තියක් සිදු වන අවස්ථාව මින් කුමක් ද?
PAPERMASTER.LK
(1) දෙහිවලින් ලුණු දෙහි සකස් කිරීම
(2) මාළු රැගෙන යන පෙට්ටිවලට අයිස් කැට දමා තිබීම
(3) තමන්ට අවශ්‍ය ප්‍රමාණයට වඩා ආහාර බෙදා ගැනීම

**55.** පහත උපකරණ කට්ටලය යොදාගෙන නිරීක්ෂණයට බලාපොරොත්තු වන දේ කුමක් ද?




(1) හිරු එළියෙන් උණුසුම ලබාගෙන ද්‍රව්‍ය රත් කිරීම
(2) පෘථිවියට දිවා, රාත්‍රි වෙනස ඇතිවීම
(3) අහසේ පායන දේදුන්නක තිබෙන විවිධ වර්ණ හඳුනා ගැනීම

**56.** හොඳ අස්වැන්නක් ලබා ගැනීම සඳහා වගා කිරීමට වඩාත් ම සුදුසු බීජ අඩංගු භාජනය කුමක් ද?




**57.** විටමින් 'A' බහුල පලතුරකි,
(1) පේර. (2) ගස්ලබු. (3) නෙල්ලි.

**58.** නරක් වූ පොල් ගෙඩියක ලක්ෂණයක් **නොවන්නේ**,
(1) දුර්ගන්ධයක් තිබීමයි. (2) සෙවල ගතියක් තිබීමයි. (3) ගුල්ලන් සිටීමයි.

**59.** සමාජ විරෝධී ක්‍රියාවක් දුටු විට දැනුම් දිය යුතු පොලිස් හදිසි ඇමතුම් අංකය කුමක් ද?
(1) 119 (2) 1911 (3) 1929

**60.** පාසලේ නිවාසාන්තර ක්‍රීඩා තරගය නැරඹීමට සුනිමල් ක්‍රීඩා පිටියට ගියේ ය. ඒ වන විට ආරම්භ වීමට නියමිතව තිබුණේ මීටර 100 දිවීමේ තරගයකි. එම තරගයට සුනිමල්ගේ අයියා ද සහභාගී වීමට නියමිතව තිබුණි. සුනිමල් ඔබ යැයි සිතා ඉන් පසු සිදු වූ දේ කුමක් ද යන්න පිළිබඳ විස්තර කෙරෙන වාක්‍ය **තුනක්** ලියන්න. (සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩු විය යුතු ය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.)

1. ..........................................................................................................

..........................................................................................................

2. ..........................................................................................................

..........................................................................................................

3. ..........................................................................................................

..........................................................................................................

PAPERMASTER.LK